(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 7(5).]

# පාර්ලිමේන්තුවේ අංක 7 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2012 දෙසැම්බර් මස 08 වැනි සෙනසුරාදා**

## 2013 ජනවාරි මස 08 වැනි අඟහරුවාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1307/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මගින්, එම අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැගිලි කුලියට හෝ බද්දට ලබාගැනීම සඳහා දරන ලද මුළු පිරිවැය කොපමණද;

(ii) කුලියට හෝ බද්දට ගත් ගොඩනැගිලිවල වර්ග අඩියක් සඳහා මිල කොපමණද;

(iii) ගොඩනැගිලිවල බදු කාලය කොපමණද;

යන්න 2010 සහ 2011 වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ කිසිදු ආයතනයකට අයත් නොවන වාහන කුලියට හෝ බද්දට ලබාගැනීම සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(ii) අයත් මුළු වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) බාහිරින් ලබාගන්නා අනෙකුත් සේවා කවරේද;

(iv) ඉහත සඳහන් බාහිරින් ලබාගත් සේවා සඳහා පිරිවැය කොපමණද;

(v) බාහිරින් සේවා ලබාගැනීමේ පදනමින් ගිවිසුම්වලට එළැඹි පුද්ගල සංඛ්‍යාව කොපමණද;

(vi) සමස්ත කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව කොපමණද;

යන්නත් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට අදාළව ඉහත කී වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1645/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රදේශයේ පිහිටි බෙලිඅත්ත පොදු වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දමා වර්ෂ ගණනාවක් ගත වී ඇති බවත්;

(ii) එම වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අවසන් නොකිරීමෙන් ප්‍රදේශයේ ගොවි ජනතාව තම ගොවි නිෂ්පාදන අලෙවි කර ගැනීමේදී ගැටලු රාශියකට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ දිනය කවරේද;

(ii) එහි ඉදිකිරීම් කටයුතු නවතා දැමීමට හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කර කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1868/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ සේවය කරන ස්ථිර සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ටෙලිකොම් ආයතනයේ දිවයින පුරා ඇති ප්‍රාදේශීය කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් කාර්යාලයේ සේවය කරන ස්ථිර සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා මාසිකව ලබන වැටුප, දීමනා සහ අනෙකුත් වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ආයතනයේ අනෙකුත් විධායක ශ්‍රේණියේ නිලධාරීන් මාසිකව ලබන වැටුප්, දීමනා සහ අනෙකුත් වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2028/'11

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (6)

(අ) මෙරට නොයෙකුත් ප්‍රදේශයන්හි වෙසෙන දක්ෂ නිර්මාණ ශිල්පීන්ගේ නව නිර්මාණයන්, නව සොයාගැනීම් සහ ඔවුන් විසින් නිපදවනු ලබන යන්ත්‍ර සූත්‍ර පිළිබඳව තොරතුරු ලබා ගැනීම සඳහා ක්‍රමවේදයක් තිබේද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශක්තිමත් ආර්ථික මට්ටමක් නොමැති මෙරට නව නිපැයුම්කරුවන්ගෙන් බොහෝ දෙනෙකුට තම නිපැයුම් වැඩිදියුණු කර ඉදිරියට ගෙන යෑමට හැකියාවක් නොමැති බවත්;

(ii) සමාජයේ ඇති හැකි අය එම පිරිසට මූල්‍යමය උපකාර ලබා දීමට මැලිකමක් දක්වන බවත්;

එතුමිය පිළිගන්නෙහිද?

(ඇ) (i) නව නිපැයුම්කරුවන්ගේ නිෂ්පාදන තුළින් මෙරට ආර්ථිකයට හා ප්‍රජාවට ලැබෙන ප්‍රතිලාභ නිවැරදි ඇගයීමකට ලක්කිරීමටත්;

(ii) ඒ අනුව ඵලදායි නව නිපැයුම් කළ නිපැයුම්කරුවන්ට දිරිදීම් ලබා දී එම භාණ්ඩ නිෂ්පාදනය කර්මාන්තයක් ලෙස වැඩි දියුණු කිරීමටත්;

අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2304/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පසුගිය වර්ෂ දහයක කාලය තුළ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නිවාඩු ලබාගෙන සහ ස්ථිර වශයෙන් වෘත්තියෙන් ඉවත් වී ගුරුවරුන් ලෙස සේවය කිරීම සඳහා විදේශගත වූ ගුරුවරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පසුගිය වර්ෂ දහය තුළ මෙරට අධ්‍යාපන අමාත්‍යාංශයේ පත්වීම් ලබා ගුරු වෘත්තියේ යෙදී සිටින විදේශිකයන් සංඛ්‍යාව ඔවුන්ගේ රට අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2378/'12

ගරු අනෝමා ගමගේ මහත්මිය,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ සංවර්ධනය උදෙසා හා ජාත්‍යන්තරව ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපයට හානි කරනු ලබන විදේශීය බලපෑම් අවම කරවීමට අවශ්‍ය අන්තර්ජාතික සහයෝගය ලබා ගැනීමට හිතකර රාජ්‍ය තාන්ත්‍රික සබඳතා වැඩි දියුණුකිරීමේ අරමුණින් 2011 වර්ෂයේදී රජය විසින් සිදු කරන ලද විදේශ ගමන් කවරේද;

(ii) එම විදේශ සංචාර සඳහා සහභාගීවූවන් කවුරුන්ද;

(iii) ඒ වෙනුවෙන් වැයවූ මුදල කොපමණද;

(iv) එම විදේශ සංචාර නිසා ශ්‍රී ලංකාවට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම් මන්ද?

2491/'12

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) බහරේන්හි සේවය කළ, අක්මීමන, හියාරේ, නුගේකන්ද ප්‍රදේශයේ පදිංචි මාදුගැට ගමගේ ධර්මවතී නැමැති තිදරු මවට ඇය සේවය කළ අදාළ නිවසේ හිමිකාර කාන්තාව විසින් බලෙන් කම්බි කොකු ගිල්වීම හේතුවෙන් අසාධ්‍යව මේ වනවිට ශ්‍රී ලංකාවට ගෙන්වා ඇති බවත්;

(ii) විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක 'සහන් පියස' රක්ෂණ ක්‍රමය යටතේ ඇය හිමිකම් මුදලක් ඉල්ලා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) සහන් පියස රක්ෂණ ක්‍රමය යටතේ ධර්මවතී මහත්මියට හිමිකම් මුදලක් ලබාදීමට මේ වනවිට ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1380/'11

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2011 ලෝක කුසලාන ක්‍රිකට් තරඟාවලිය සඳහා ශ්‍රී ලංකාව සම සත්කාරක රටක් වන බව ලෝක කුසලාන ක්‍රිකට් කවුන්සිලය විසින් ශ්‍රී ලංකාව වෙත දැනුම් දෙනු ලැබූ දිනය කවරේද;

(ii) ලෝක කුසලාන තරඟ සඳහා දැනට පවතින ක්‍රිකට් ක්‍රීඩාංගන නවීකරණය සඳහා වියදම් කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) දැනට පවතින ක්‍රිකට් ක්‍රීඩාංගන නවීකරණය සහ අලුතින් ක්‍රිකට් ක්‍රීඩාංගන ඉදිකිරීම සඳහා වන වියදම් අනුමත කිරීම පිණිස බලය පවරා දෙනු ලැබූ පුද්ගලයන්ගේ නම් කවරේද;

(iv) ක්‍රීඩාංගන ඉදිකිරීම් අනුමත වියදම්වලට අනුකූලව සිදු කරනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1647/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ, මුන්දලම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි කොට්ටන්තිවු ග්‍රාමීය රෝහල විවෘත කර වර්ෂ හයක් ගතවී ඇතත් මෙතෙක් කිසිම රෝගියකු රෝහලට ඇතුළත් කරගෙන නොමැති බවත්;

(ii) රෝහල විවෘත කළ ද භෞතික සම්පත් සහ මානව සම්පත් නිසි ලෙස ලබා නොදීම නිසා මෙම තත්ත්වය ඇති වී තිබෙන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතාවන් ඉටු කිරීම සඳහා රෝහලේ පවතින අඩුපාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1870/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ අන්තර්ජාල හරහා ඇමතුම් අංශයේ (VOIP) දිනක ආදායම හා මාසික ආදායම කොපමණද;

(ii) එම අංශය මේ වනවිට වසා දමා තිබේද;

(iii) එසේ නම්, වසා දමන ලද දිනය කවරේද;

(iv) එම අංශය වසා දැමීමට හේතු කවරේද;

(v) වසා දමන අවස්ථාවේ දී එම අංශය ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2217/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ, ජනසෙවන වැඩසටහන යටතේ කොළඹ නගරය තුළ පැල්පත් හා සෙසු අවිධිමත් නිවාසවල වෙසෙන ජනතාව සඳහා නව නිවාස 65,000ක් ඉදිකිරීමට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි මේ වනවිට ඉදිකිරීම් අවසන් කර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස ඉදිකර ඇති ස්ථාන කවරේද;

(iii) මේ වනවිට එම නිවාසයන්හි පදිංචි කර ඇති මුළු පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1406/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ මෙරටින් පිටරටවලට විදේශ විනිමය ඇදී යාමට හේතුවූ ඉතාම වැදගත් ආනයන භාණ්ඩ පහළොවෙහි ප්‍රමාණයන් සහ වටිනාකම් කවරේද;

(ii) එම භාණ්ඩ ආනයනය කරන ලැබූ රටවල නම් කවරේද;

යන්න වාර්ෂික පදනමින්, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දේශීයව නිපදවනු ලබන භාණ්ඩ හා සේවාවන් හෝ මිල අඩු විකල්ප යොදාගනිමින් එම භාණ්ඩ ආනයනය කරනු ලබන ප්‍රමාණය අඩු කිරීමට හැකියාවක් තිබේද;

(ii) එසේ නම්, ආනයනය කිරීම සහ දේශීයව නිෂ්පාදනය කිරීම අතර වෙනසේ වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ශ්‍රී ලාංකීය නිෂ්පාදන දිරිගැන්වීමේ හැකියාවක් තිබේද;

(ii) එසේ නිෂ්පාදනය කළ හැකි නම්, ඒ බව සනාථ කළ හැකි සාක්ෂි වාර්ෂික පදනමින් කවරේද;

(iii) ඉහත කී පනත ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් වාර්ෂිකව ඉතිරි කර ගැනීමට හැකිවන විදේශ විනිමය ප්‍රමාණය සහ ජනනය කිරීමට හැකිවන රැකියා ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1871/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) යාපනයේ පිහිටි ටෙලිකොම් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය සඳහා ඇස්තමේන්තු කළ මුදල කොපමණද;

(ii) එම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේ නම්, ඒ සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කළ අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) ටෙන්ඩර් පටිපාටිය අනුව අඩුම මිල ගණන් යටතේ ඉල්ලුම්පත් යොමු කළ අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එකී ටෙන්ඩරය ලබා දුන් පුද්ගලයාගේ හෝ ආයතනයේ නම සහ ටෙන්ඩරය ලබා දුන් මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වනවිට එකී ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා දරන ලද සමස්ත පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1882/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ, ගිංතොට, පියදිගම ප්‍රදේශයේ පවත්වාගෙන ගිය කොහු ආශ්‍රිත නිෂ්පාදන පුහුණු මධ්‍යස්ථානය මීට වර්ෂ කිහිපයකට පෙර සිට වසා දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ආයතනය වසා දැමීමට හේතු කවරේද;

(ii) එම මධ්‍යස්ථානය සතුව පැවති බලවේග යන්ත්‍ර සහ අත්ලණු යන්ත්‍රවලට සිදුවූයේ කුමක්ද;

(iii) ගිංතොට, පියදිගම කොහු ආශ්‍රිත නිෂ්පාදන පුහුණු මධ්‍යස්ථානය නැවත ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

(iv) ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(v) එසේ නම්, නිෂ්පාදන සහ පුහුණුවීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2219/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ, ජනසෙවන වැඩසටහන යටතේ කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල රජයේ සේවකයින් වෙනුවෙන් මහල් නිවාස යෝජනා ක්‍රම හතරක් ක්‍රියාත්මක කිරීමට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් නිවාස යෝජනා ක්‍රම අතරින් මේ වනවිට ඉදිකිරීම් අවසන් කර ඇති යෝජනා ක්‍රම සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස යෝජනා ක්‍රම පිහිටි ප්‍රදේශ කවරේද;

(iii) මේ වනවිට එම මහල් නිවාසවල පදිංචිකර ඇති රජයේ සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් මහල් නිවාස යෝජනා ක්‍රමය සඳහා වෙන් කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 140, 141 සහ 164 වැනි වගන්ති යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012.12.07 වැනි දින ඉදිරිපත් කරන ලද 2012 ජුනි 22 දිනැති අංක 1763/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ සහ 2012 ඔක්තෝබර් 10 දිනැති අංක 1779/17 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධනය කරන ලද නියෝග අනුමත කළ යුතුය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## 2013 ජනවාරි මස 09 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1407/'11

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) විගණකාධිපති දෙපාර්තමේන්තුව පිහිටුවනු ලැබූ දිනය කවරේද;

(ii) විගණකාධිපති දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම දෙපාර්තමේන්තුවේ වත්මන් සේවක සංඛ්‍යාව කොපමණද;

(iv) කාර්ය මණ්ඩලයේ පිරවීමට ඇති පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(v) කාර්ය මණ්ඩලයට හිමි වැටුප් සහ අනෙකුත් දීමනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) විගණකාධිපති දෙපාර්තමේන්තුව දේශපාලනීකරණය වීම පිළිබඳව එක්සත් ජාතීන්ගේ වාර්තාවේ සඳහන්වී තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1886/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ, අම්බලන්ගොඩ තානායමට අයත් ගොඩනැගිලි කඩා දමා යළි ඉදිකිරීමට මුල්ගල් තබා වර්ෂ දෙකකට වැඩි කාලයක් ගත වී ඇතත්, මේ දක්වා එම ඉදිකිරීම් කටයුතු ආරම්භකර නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම තානායම නැවත ඉදිකිරීමේ කටයුතු අතරමග නවතා දැමීමට හේතු කවරේද;

(ii) එම ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අම්බලන්ගොඩ නගර සභාව සතු මෙම ගොඩනැගිලි කඩා දැමීමට රුහුණු සංචාරක කාර්යාලයට බලය හිමි වූයේ කෙසේද;

(ii) එම ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවදාද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1903/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) කාල්ටන් ක්‍රීඩා නාලිකාවේ (CSN) අයිතිය රජය හෝ රජය අනුබද්ධ ආයතනයක් සතුවන්නේද;

(ii) එහි අයිතිය පෞද්ගලික ආයතනයක් සතු නම්, එම ආයතනයේ හිමිකරු හෝ හිමිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) එම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කාල්ටන් ක්‍රීඩා නාලිකාවේ විකාශන කටයුතු ආරම්භ කළ දිනය හෝ ආරම්භ කිරීමට නියමිත දිනය කවරේද;

(ii) එම නාලිකාව ආරම්භ කිරීමට වෙන් කළ තරංග පරාසයන් (frequency range) කවරේද;

(iii) කාල්ටන් ක්‍රීඩා නාලිකාවට විකාශන අයිතිය ලබා දෙන ලද්දේ කවර කාලසීමාවක් සඳහාද;

(iv) එම නාලිකාව ආරම්භ කිරීමට අනුමතිය ලබා දුන් ලේඛන සහ විකාශන අයිතිය ලබා දීමට අදාළ ගිවිසුම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම නාලිකාව ආරම්භ කිරීම සඳහා ගෙවන ලද මුදල කොපමණද;

(ii) එම ගෙවීමට අදාළ ලේඛන ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2220/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, ''සැමට නිවසක් - හිතට සෙවණක්'' වැඩපිළිවෙළ යටතේ, නාගරික මහල් නිවාස හා රජයේ වෙනත් නිවාස යෝජනා ක්‍රමවල පදිංචිකරුවන් තම නිවසේ සින්නක්කර අයිතිකරුවන් බවට පත්කිරීමේ වැඩපිළිවෙළ මාස තුනක් ඇතුළත නිම කරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වැඩපිළිවෙළ ආරම්භ කළ දිනය හා අවසන් කළ දිනය කවරේද;

(ii) එම වැඩසටහන යටතේ තම නිවසේ සින්නක්කර අයිතිය ලැබූ නාගරික මහල් නිවාසී පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) රජයේ වෙනත් නිවාස යෝජනා ක්‍රමවල පදිංචි ඉහත පරිදි සින්නක්කර නිවාස අයිතිය ලැබූ පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2503/'12

ගරු තලතා අතුකෝරල මහත්මිය,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂයේදී රජයේ ලියාපදිංචිවී සිටි ජනමාධ්‍යවේදීන්ගේ සංඛ්‍යාව;

(ii) එම කාලය තුළදී අතුරුදන් වූ සහ ඝාතනයට ලක්වූ මාධ්‍යවේදීන්ගේ සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 වර්ෂය වනවිට ලියාපදිංචි කර ඇති පුවත්පත්, ගුවන්විදුලි සේවාවන්, රූපවාහිනී නාලිකා සහ වෙබ් අඩවි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා තහනම් කරන ලද මාධ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් මාධ්‍ය ආයතනය තහනම් කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2526/'12

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2011 දෙසැම්බර් 31 වනවිට,

(i) මෙරට පැවති ජාතික පාසල් සංඛ්‍යාව;

(ii) එම පාසල්වල සිටි ශිෂ්‍ය සංඛ්‍යාව හා ගුරුවරුන් සංඛ්‍යාව;

(iii) ජාතික පාසල් සඳහා 2012 වර්ෂය වෙනුවෙන් වෙන්කළ මුළු මුදල;

(iv) මේ වනවිට විදුහල්පති පුරප්පාඩු පවතින ජාතික පාසල් සංඛ්‍යාව;

(v) ජාතික පාසල්වල පළමුවැනි ශ්‍රේණියට ඇතුළුවීම සඳහා 2011 සහ 2012 වර්ෂ තුළදී ඉල්ලුම් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව;

(vi) ඉල්ලුම් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාවෙන් එම පාසල්වලට ඇතුළත් කරගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2884/'12

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සමූපකාර සමිතිවල මූල්‍ය හා පරිපාලන බලතල නිලවරණයෙන් පත්වන සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත හිමිවීමෙන් එම සමිතිවල දූෂණ හා අක්‍රමිකතා සිදුවන බවත්;

(ii) එම තත්ත්වය යටතේ මාතලේ, රත්තොට විවිධ සේවා සමූපකාර සමිතියේ මූල්‍ය පරිපාලනයේදී සිදුව ඇති වංචා හා දූෂණ හේතුවෙන් එය දැඩි මූල්‍ය අර්බුදයකට ලක්ව ඇති බවත්;

(iii) මූල්‍ය අර්බුදය හේතුවෙන්, එම සමූපකාර සමිතියට තම ප්‍රදේශික සහ "කෝප්සිටි" පවත්වාගෙන යෑමට නොහැකිවීමෙන් පාරිභෝගිකයින් දැඩි පීඩාවට පත්ව ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) රත්තොට විවිධ සේවා සමූපකාර සමිතියේ,

(i) ප්‍රාදේශික සහ "කෝප්සිටි" සංඛ්‍යාව හා දැනට ක්‍රියාකාරී තත්ත්වයේ ඇති ප්‍රාදේශික සහ "කෝප්සිටි" සංඛ්‍යාව සහ සේවක සංඛ්‍යාව;

(ii) නිලවරණයට ප්‍රාදේශිකවලින් සහභාගි විය යුතු මහ සභා නියෝජිතයන් සංඛ්‍යාව සහ 2010.03.20 දින නිලවරණයට සහභාගී වූ නියෝජිතයන් සංඛ්‍යාව;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සමූපකාර සමිතිවල පරිපාලන දුර්වලතා, දූෂණ හා අක්‍රමිකතා පිළිබඳව ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(ii) රත්තොට විවිධ සේවා සමූපකාර සමිතියේ සිදු වී ඇති අක්‍රමිකතා පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1543/'11

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2011 ජුනි මස 01 වැනි දින සිට කැබිනට් අමාත්‍යවරයෙකුට ගෙවනු ලබන මාසික වැටුප කොපමණද;

(ii) අමාත්‍යවරයෙකු සහ අමාත්‍යවරයෙකු සඳහා පත් කර ඇති කාර්ය මණ්ඩලය විසින් මාසිකව භුක්ති විඳිනා වෙනත් අමතර ප්‍රතිලාභ කවරේද;

(iii) 2011 ජුනි මස 01 වැනි දින සිට නියෝජ්‍ය අමාත්‍යවරුන් සඳහා ගෙවනු ලබන මාසික වැටුප කොපමණද;

(iv) නියෝජ්‍ය අමාත්‍යවරයෙකු සහ ඔහුගේ කාර්ය මණ්ඩලය මාසිකව භුක්ති විඳිනා වෙනත් අමතර ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අමාත්‍යවරයකුට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකුට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට හිමි මාසික වැටුප ගෙවනු ලබන්නේ නම්, එකී අමාත්‍යවරයා හෝ නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් ලබා ගන්නා මාසික වැටුප කොපමණද;

(ii) අමාත්‍යවරුන් / නියෝජ්‍ය අමාත්‍යවරුන් විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස ඉහත (අ) කොටසෙහි සඳහන් ප්‍රතිලාභ භුක්ති විඳින්නේද;

(iii) අමාත්‍යවරුන්ට / නියෝජ්‍ය අමාත්‍යවරුන්ට ප්‍රමාණවත් වැටුපක් ගෙවනු ලබන්නේද;

(iv) නොඑසේ නම්, එම කරුණ නිවැරදි කරනු ලබන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1889/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, හක්මණ ප්‍රදේශයේ පිහිටි මාවරල ප්‍රාදේශීය රෝහලෙහි මෘත ශරීරාගාරය ඉතා අබලන් වී ඇති බවත්;

(ii) ඉතා දුෂ්කර ප්‍රදේශයක පිහිටි එම රෝහලෙහි පවතින ඉහත අඩුපාඩුව නිසා ප්‍රදේශවාසීන් දැඩි දුෂ්කරතාවන්ට මුහුණපාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොඩනැගිල්ල කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) මේ වනවිට ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1907/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ජාතික රූපවාහිනිය සතු ක්‍රීඩා තරග පටිගත කළ කැසට් පට හෝ දෘඪ තැටි කාල්ටන් ක්‍රීඩා නාලිකාව (CSN) වෙත ලබා දීමට කටයුතු යොදා තිබේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) එම කැසට් පට හෝ දෘඪ තැටි ලබා දුන් පදනම කවරේද;

(iv) එම කැසට් පට ලබා ගැනීම වෙනුවෙන් කාල්ටන් ක්‍රීඩා නාලිකාව විසින් ජාතික රූපවාහිනිය වෙත ගෙවන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කාල්ටන් ක්‍රීඩා නාලිකාව විසින් එම කැසට් පට හෝ දෘඪ තැටි ලබා දෙන ලෙස ඉල්ලීමක් කළේ නම්, එම ඉල්ලීම් කළ අයගේ විස්තර කවරේද;

(ii) එකී ඉල්ලුම් ලිපිය කුමක්ද;

(iii) ජාතික රූපවාහිනිය විසින් එකී කැසට් පට හෝ දෘඪ තැටි නිදහස් කිරීමට බලය ලබා දුන් නිලධාරියාගේ නම සහ තනතුර කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2221/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, වර්ෂ 2015 වනවිට සෑම වතු සේවක පවුලකටම මූලික පහසුකම් සහිත නව නිවසක් ලබා දෙන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි මේ වනවිට නව නිවාස හිමි වූ වතු සේවක පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට ඉදිවෙමින් පවතින වතු නිවාස සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1849/'11

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2004 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ එක් එක් වර්ෂයේදී රජය විසින් ඉතාලිය සහ මැලේසියාව යන රටවලට රැකියා සඳහා යවන ලද ශ්‍රී ලාංකිකයින්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඉතාලියට සහ මැලේසියාවට පුද්ගලයන් යැවීමේදී ඒ සඳහා පාදක කරගත් නිර්ණායකය කවරේද;

(iii) එම රටවල රැකියාවක් ලබාදීම සඳහා එක් පුද්ගලයෙකුගෙන් අයකරගත් මුදල කොපමණද;

(iv) ඉහත කී රටවලට රජය විසින් යවන ලද පුද්ගලයෙකුගේ රැකියාවට අදාළ ගිවිසුමේ කාලසීමාව කොපමණද;

(v) එම රටවල රැකියාවක නියුතු පුද්ගලයෙකුගේ සාමාන්‍ය වැටුප කොපමණද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1940/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ භාණ්ඩ ගබඩා කිරීමට වෙන්කර තිබූ ගුදම් අංක 04 මන්නාරමේ තෙල් කැණීමේ නිරත ඉන්දියානු සමාගමකට ලබාදී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගුදම ඉන්දියානු සමාගමට ලබාදීමට හේතු කවරේද;

(ii) එය ලබා දී ඇති පදනම කවරේද;

(iii) එම ගුදම ඉන්දියානු සමාගමකට ලබාදීමෙන් අපේක්ෂිත ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1986/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) මේ වනවිට රජය සතු පෞද්ගලික සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමාගම්වල නම් සහ ඒවා අදාළ වන අමාත්‍යාංශය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩල සමාජිකයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම එක් එක් සමාගම්වල ශ්‍රී ලංකා රජය සතු කොටස්වල ප්‍රතිශතය සහ පෞද්ගලික අංශය විසින් ආයෝජනය කර ඇති කොටස්වල ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) පෞද්ගලික ආයෝජකයින්ගේ නම් සහ ලිපිනයන් එක් එක් සමාගම අනුව කවරේද;

(vi) එම එක් එක් සමාගම 2009 සහ 2010 වර්ෂවලදී ලබා ඇති ශුද්ධ ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2222/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, ධීවර නගර හා ගම්මාන ඉලක්ක කර ගෙන නිවාස 30,000 ක් ඉදිකිරීම සඳහා රුපියල් කෝටි 150 ක් වෙන් කරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි රුපියල් කෝටි 150 ක මුදලක් වෙන් කළේ කුමන වර්ෂයේ අයවැයෙන්ද;

(ii) මේ වනවිට ඉදිකිරීම් අවසන් කර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාසවල පදිංචිකර ඇති ධීවර පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 ජනවාරි මස 22 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1546/'11

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හම්බන්තොට වරායේ ඉදිකිරීම් කටයුතු අවසන් වනවිට එහි ශ්‍රමය සඳහා වූ වියදම කොපමණදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හම්බන්තොට වරායේ ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි සේවයේ නිරතව සිටින විදේශ ශ්‍රමිකයින් සංඛ්‍යාව සහ දේශීය ශ්‍රමිකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) විදේශීය ශ්‍රමිකයින් ශ්‍රී ලංකාවට රැගෙන ආ සමාගම හෝ රට විසින් ඔවුන්ට ලබා දී තිබූ තනතුරු නාමයන් කවරේද;

(iii) හම්බන්තොට වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ සේවකයින් වෙනුවෙන්, සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල වෙත ගෙවා ඇති දායක මුදල්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1823/’11

ගරු බුද්ධික පතිරණ මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පදිංචි හෙන්රි නෙල්සන් රත්නායක මහතා තිහගොඩ මංසන්ධියේ ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යනු ලබන බවත්;

(ii) එම පිරවුම්හලේ පෙට්‍රල් අලෙවිය සඳහා අවස්ථා කීපයකදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් අවසරය ඉල්ලා ඇතත් මේ දක්වා එම අවසරය ලැබී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ඉන්ධන පිරවුම්හලේ අනෙකුත් ඉන්ධන අලෙවි කිරීමට අවසර ලබාදී තිබියදී පෙට්‍රල් අලෙවියට ඉඩ නොදීමට හේතු කවරේද;

(ii) නෙල්සන් රත්නායක මහතාට පෙට්‍රල් අලෙවිය සඳහා අවසර ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2123/’11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සීමාසහිත මගනැගුම මාර්ග ඉදිකිරීම් උපකරණ සමාගමේ ආයෝජනය කර ඇති මුදල කොපමණද;

(ii) එකී මුදල් ආයෝජනය කළ වර්ෂයන් කවරේද;

(iii) එකී ආයෝජනයන් සඳහා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(iv) එම මුදල් අයෝජනය කිරීමට තීරණය කළ අය කවුරුන්ද;

(v) ඒ සඳහා මුදල් අමාත්‍යාංශයෙන් අනුමතිය ලබා ගෙන තිබේද;

(vi) එසේ නම්, ඊට අදාළ ලේඛන සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2213/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවන වැඩසටහන යටතේ, විදේශගත ශ්‍රමිකයන් සඳහා රජයෙන් 30%ක දායකත්වය ලබාදෙන නිවාස ණය ක්‍රමයක් සකස් කිරීමට පියවර ගන්නා බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම නිවාස ණය ක්‍රමය ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වනවිට එම නිවාස ණය ක්‍රමය යටතේ ණය ලබාගෙන ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2537/'12

ගරු අනුර දිසානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ විකාශය කිරීමේ අයිතිය රාජ්‍ය රූපවාහිනී නාලිකාවලට අමතරව පෞද්ගලික නාලිකාවලට ලබාදීමේ පදනම කවරේද;

(ii) පසුගියදා පැවති කොමන්වෙල්ත් බැන්ක් (Commonwealth Bank) කුසලාන ක්‍රිකට් තරගාවලිය ලංකාවේ විකාශය කළ රූපවාහිනී නාලිකාව කවරේද;

(iii) එම නාලිකාව ඒ සඳහා තෝරා ගැනීමේ පදනම කවරේද;

(iv) ජාත්‍යන්තර ක්‍රීඩා තරග විකාශය කිරීමට සියලුම රූපවාහිනී නාලිකාවලට අවසර ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2552/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2012 වර්ෂය තුළ ශ්‍රී ලංකා පොලීසියේ කැරලි මර්ධන අංශය සඳහා කඳුළු ගෑස් උණ්ඩ හා උපකරණ, මුහුණු ආවරණ, හෙල්මට් හා අත් ආවරණ තහඩු, රබර් උණ්ඩ සහ බැටන් පොලු මිලදී ගැනීමට ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබූ එක් එක් අයිතමයේ ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් එක් අයිතමය වෙනුවෙන් ඉදිරිපත් කර ඇති මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත සමස්ත මිලදී ගැනීම් වෙනුවෙන් වෙන් කර ඇති මුදල කොපමණද;

(v) එම අයිතමයන් මිලදී ගැනීම සඳහා හදිසි අවශ්‍යතාවයක් මතුවී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2855/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා යුද හමුදාව තුළ දැනටත් සේවය කරන ක්‍රියාන්විත මෙහෙයුම් හේතුවෙන් ආබාධිත වූ සෙබළුන් සහ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) යුද හමුදාවේ සෙබළුන්ට සහ නිලධාරීන්ට විශ්‍රාමගැනීම සඳහා සම්පූර්ණ කළ යුතු අවම සේවා කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) යුද හමුදාවේ සේවයෙන් විශ්‍රාම යෑම සඳහා සම්පූර්ණ කළයුතු අවම සේවා කාලයට පෙර විශ්‍රාමයාමට දැනට සේවයේ නියුතු ආබාධිත සෙබළුන්ට සහ නිලධාරීන්ට හැකියාව තිබේද;

(ii) එසේ නම්, එම ආකාරය කවරේද;

(iii) එසේ නොමැති නම්, ආබාධිත හමුදා නිලධාරීන්ට සහ සෙබළුන්ට ඔවුන්ගේ පෞද්ගලික කැමැත්ත මත විශ්‍රාම යෑම සඳහා සුදුසු ප්‍රතිපත්තියක් සකස් කිරීම සුදුසු බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1548/'11

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ දකුණ වරායේ දියකඩනය ඉදිකිරීම ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) දියකඩනය ඉදිකිරීම අවසන් කරන අවස්ථාව වනවිට ශ්‍රමය වෙනුවෙන් දරන ලද පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දියකඩනය ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි සේවය සඳහා යොදවන ලද විදේශීය සහ දේශීය සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) විදේශීය සේවකයන් ශ්‍රී ලංකාවට රැගෙන එන ලද රට හෝ සමාගම විසින් ඔවුන්ට ලබාදී තිබූ තනතුරු නාමයන් කවරේද;

(iii) දියකඩනය ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි සේවකයන් වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල වෙත ගෙවන ලද දායක මුදල්වල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1826/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2011 ලෝක කුසළාන ක්‍රිකට් තරඟාවලියට අදාළව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සිදුකළ වියදම් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ප්‍රිමියර් ලීග් ක්‍රිකට් තරඟාවලියේ විකාශන අයිතිය ලබා දී තිබෙන සමාගමෙහි නම කුමක්ද;

(ii) එම ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කරන පුද්ගලයා කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2011 ලෝක කුසලාන ක්‍රිකට් තරඟාවලියේදී ශ්‍රී ලංකාවට ලැබුණු මුදල් සම්භාරයෙන් හම්බන්තොට ක්‍රීඩාංගණය ගොඩනැගීමට සහ අනෙකුත් ක්‍රීඩාංගණ සඳහා වැයකළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2131/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හිටපු අමාත්‍යවරයෙකු විසින් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වාහන රැගෙන ගොස් තිබේද;

(ii) එසේ නම්, එම තැනැත්තා කවුරුන්ද;

(iii) ඔහු රැගෙන ගොස් ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(iv) එම වාහනවල වර්ග සහ ලියාපදිංචි අංක කවරේද;

(v) එම වාහන රැගෙන ගිය දිනය කවරේද;

(vi) මාර්ග සංවර්ධන අධිකාරිය වෙත එම වාහන ආපසු ලබා දුන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජයේ වාහන ඉහත පරිදි රැගෙන යාම 2004.01.08 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනි බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම වාහන රැගෙන යාම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2214/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවන වැඩසටහන යටතේ, මධ්‍යම පාන්තිකයන්ට පහසු මිලට ලබාදීම සඳහා තට්ටු නිවාස ඉදිකරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මධ්‍යම පාන්තිකයන්ට පහසු මිලට ලබා දීම සඳහා තට්ටු නිවාස ඉදිකිරීම ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වනවිට ඉදිකිරීම් අවසන් කර ඇති එම තට්ටු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම තට්ටු නිවාස ඉදිකර ඇති ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1554/'11

ගරු රවී කරුණානායක මහතා,— සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විහාරමහා දේවී උද්‍යානය අසල ඉදිකර ඇති චීන සංස්කෘතික මධ්‍යස්ථානය 2002 - 2004 කාල සීමාව තුළදී ගරු රනිල් වික්‍රමසිංහ මහතාගේ අග්‍රාමාත්‍යධුරය යටතේ චීන රජයෙන් ශ්‍රී ලංකා රජයට ලැබුණු ත්‍යාගයක්ද;

(ii) එය පූර්ණ ප්‍රදානයක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) චීන සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ආරම්භ වූ දිනය සහ අවසන් වූ දිනය කවරේද;

(ii) ඉහත ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කළ මුළු පිරිවැය සහ එය අවසන් කිරීමේදී දැරීමට සිදු වූ පිරිවැය කොපමණද;

(iii) එම ව්‍යාපෘතියෙහි ශ්‍රමය සඳහා වැයවූ පිරිවැය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ව්‍යාපෘතියේ සේවයේ යෙදවූ දේශීය සහ විදේශීය සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කී ව්‍යාපෘතියේ විදේශික ශ්‍රමිකයන්ට, ඔවුන් ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබූ සමාගම හෝ රට විසින් ලබා දී තිබූ තනතුරු නාමයන් කවරේද;

(iii) චීන සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතියේ සේවකයන් වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල වෙත ගෙවන ලද දායක මුදල් ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1828/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) තැපැල් දෙපාර්තමේන්තුවේ මේ වනවිට විශාල පුරප්පාඩු ප්‍රමාණයක් පවතින බවත්;

(ii) 2006 වර්ෂයේදී තැපැල් දෙපාර්තමේන්තුවට තැපැල් නිලධාරීන් බඳවා ගැනීමේ තරඟ විභාගය සඳහා ඉල්ලුම්පත් කැඳවූ බවත්;

(iii) එම තරඟ විභාගය 2007 වර්ෂයේදී පවත්වා 2008 වර්ෂයේදී ප්‍රතිඵල නිකුත් කර ඇති බවත්;

(iv) එම ප්‍රතිඵල අනුව මෙතෙක් බඳවා ගැනීම් සිදුකර නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) 2008 වර්ෂයේ නිකුත් කළ විභාග ප්‍රතිඵල අනුව අදාළ බඳවා ගැනීම් සිදු නොකිරීමට හේතු කවරේද;

(ii) එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2133/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවට ලබා ගැනීම වෙනුවෙන් වියදම් කළ මුදල සපයා ගත් ආකාරය කවරේද;

(ii) එකී වියදම් සිදු කළ අයිතමයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත තරඟාවලියේ සත්කාරකත්වය ශ්‍රී ලංකාවට ලබා ගැනීම සඳහා සිදු කළ වියදම් හේතුවෙන් මෙරටට ප්‍රතිලාභයක් ලැබුනේද;

(ii) එසේ නම්, එම ප්‍රතිලාභ කවරේද;

(iii) එම ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවට ලබා ගැනීම සඳහා කටයුතු කළ කමිටුවේ සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් සාමජිකයාගේ නම, තනතුර සහ ඒ සඳහා ඇති සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2215/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවන වැඩසටහන යටතේ, සෑම ගමකටම වර්ෂයකට නිවාස 25 බැගින් ඉදිකිරීමට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි මේ වනවිට ඉදිකිරීම් අවසන් කර, ප්‍රතිලාභීන් පදිංචි කර ඇති සමස්ත නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස පිහිටි ගම්වල නම් කවරේද;

(iii) එක් නිවසක් ඉදිකිරීම සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 ජනවාරි මස 23 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1601/'11

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2004.01.01 දින සිට අද දක්වා වූ කාලය තුළ අධිචෝදනා ගොනුකිරීමෙන් පසුව නීතිපතිවරයා විසින් ඉල්ලා අස්කරගෙන ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එලෙස අධිචෝදනා ඉදිරිපත් කරන ලද නඩුවල සහ පුද්ගලයන්ගේ නම් සහ එම අධිචෝදනාපත්‍ර භාරදුන් දිනයන් කවරේද;

(iii) එලෙස අධිචෝදනාපත්‍ර භාරදීමෙන් අනතුරුව ඒවා ඉල්ලා අස්කර ගැනීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) භාරදුන් අධිචෝදනාපත්‍රයක් ඉල්ලා අස්කර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් දරන ලද වියදම කොපමණද;

(ii) ඒ සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන්ගේ නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1829/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය අධ්‍යාපන කාර්යාලයට අයත්, මොරවක, කොටපොල හා පස්ගොඩ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවලින් පාලනය වන රජයේ පාසල්වල දුෂ්කර සේවා කාලය අවසන්වීමෙන් පසු ස්ථාන මාරුවීම් නොලැබීම නිසා දැඩි කලකිරීමට පත් විශාල ගුරු පිරිසක් සිටින බවත්;

(ii) මෙම හේතුව නිසා එම ගුරුවරුන්ගේ ඉගැන්වීමේ කටයුතුවල ගුණාත්මකභාවය පිරිහීමට ලක් විය හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ගුරු මාරු මණ්ඩල තීරණයන්ට අනුව ස්ථාන මාරු සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම් කවරේද;

(ii) මේ වනවිට ඉහත අධ්‍යාපන කලාප තුළ දුෂ්කර සේවා කාලය අවසන්වීමෙන් පසු ස්ථාන මාරුවීම් ඉල්ලා ඇති ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ට ස්ථාන මාරුවීම් ලබා දීම සඳහා වැඩ පිළිවෙළක් සකසා තිබේද;

(iv) එම ක්‍රමවේදය කවරේද;

(v) ඒ අනුව ස්ථාන මාරු ලබා දෙන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2150/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1992 වර්ෂයේ දී ගුවන් තොටුපල හා ගුවන් සංතරණ අධිකාරියට අරමුදල් රැස් කිරීම පිණිස ආරම්භ කළ ලොතරැයිපතේ වටිනාකම කොපමණද;

(ii) මේ වනවිට මුද්‍රණය කර ඇති එම ලොතරැයිපත් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ලොතරැයිපතේ නම කුමක්ද;

(iv) එම ලොතරැයිපතින් ලැබූ ලාභය හෝ අලාභය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ලොතරැයිය දිනුම් අදින ලද දිනය කවරේද;

(vi) ඒ යටතේ බෙදාදුන් ත්‍යාග කවරේද;

(vii) ඉහත ලොතරැයිපත ආරම්භ කිරීමෙන් අපේක්ෂිත ඉලක්ක මේ වනවිට සපුරාගෙන තිබේද;

(viii) එසේ නම්, ඊට අදාළ තොරතුරු ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2216/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවන වැඩසටහන යටතේ, පළමු වර්ෂ පහේදී පොලිය පමණක් ගෙවීමේ පහසුකම සහිත නිවාස ණය යෝජනා ක්‍රමයක් ඇතිකිරීමට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි එම නිවාස ණය යෝජනා ක්‍රමය ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වනවිට එකී නිවාස ණය ලබා දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) නිවාස ණය ලබාදීමේදී ප්‍රතිලාභීන් තෝරා ගත් පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2539/'12

ගරු අනුර දිසානායක මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගමේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් එක් සාමාජිකයා විසින් 2009 වර්ෂයේ සිට මේ දක්වා යෙදී ඇති විදෙස් සංචාර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් සංචාරය සිදුකළ රටවල්, ඒවායේ අරමුණු හා ඉන් ලැබුණු ප්‍රතිඵල එක් එක් සංචාරය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් එක් සංචාරය සඳහා ඒ ඒ පුද්ගලයා වෙනුවෙන් වැය කළ මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2556/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) "අපි වෙනුවෙන් අපි" අරමුදල යොදාගනිමින් මේ වනවිට හමුදා සෙබළුන් වෙනුවෙන් සාදා නිමකර ඇති නිවාස සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමෙන්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එසේ සම්පූර්ණ කරන ලද නිවාසවලින් හමුදා පවුල් වෙත ලබාදී ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් නිවසක දළ වටිනාකම කොපමණද;

(iv) එම නිවාස ලබාදීම සඳහා හමුදා පවුල් තෝරාගැනීමේ පදනම කවරේද;

(v) ලබාගත් නිවසක් වෙනුවෙන් හමුදා සෙබළෙක් මාසිකව ගෙවිය යුතු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2912/'12

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 1999 වර්ෂයේ උපාධිධාරී අභ්‍යාසලාභී ගුරුවරුන් ලෙස බඳවාගත් සංඛ්‍යාව කොපමණද යන්න පළාත් අනුව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් උපාධිධාරී අභ්‍යාසලාභී ගුරුවරුන්, 2000 වර්ෂයේදී කළමනාකරණ සහකාර තනතුරුවලට පත් කළ බවත්;

(ii) 2006 වර්ෂයේදී එම පිරිස නැවත ගුරු සේවයට ඇතුළත් කරගත් බවත්;

(iii) එම ගුරුවරුන්ගේ සේවා කාලය ඔවුන් කළමනාකාර සහකාර තනතුරුවලට පත් කළ දින සිට සලකා බලා ගුරු සේවයේ 2 - II ශ්‍රේණියට උසස් කිරීමට අනුමතිය ලබා දීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කර ඇති බවත්;

(iv) එම චක්‍රලේඛය අනුව පළාත් කිහිපයක ගුරුවරුන්ට ගුරු සේවයේ 2 - II ශ්‍රේණියට උසස්වීම් ලබාදී, අදාළ වැටුප් තලයේ පිහිටුවා ඇති බවත්;

(v) මධ්‍යම පළාතේ අදාළ ගුරුවරුන්ට එම උසස්වීම් අහිමි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ආ (ii) හි සඳහන් පරිදි ගුරු සේවයට ඇතුළත් කරගත් මධ්‍යම පළාතේ ගුරු පිරිසටද 2 - II ශ්‍රේණියට උසස්වීම ලබාදීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1705/'11

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලොව පුරා පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල හෝ මහ කොමසාරිස් කාර්යාලවල සේවයේ නියුතු, තානාපතිවරු හෝ මහ කොමසාරිස්වරුන්ගේ නම්, ඔවුන් සේවයේ නියුතු රට අනුව කවරේද;

(ii) කිසියම් තානාපතිවරයෙකු හෝ මහ කොමසාරිස්වරයෙකු විසින් සිය ප්‍රධාන කාර්යාලයේ සිට වෙනත් රටවල් ද ආවරණය කරමින් සේවය කරන්නේ නම්, එම රටවල නම් කවරේද;

(iii) විදේශ දූත සේවාවෙන් පත්කර ඇති තානාපතිවරුන්ගේ / මහ කොමසාරිස්වරුන්ගේ සේවා පළපුරුද්ද කවරේද;

(iv) දේශපාලන පදනමින් තනතුරට පත්කර ඇති තානාපතිවරුන්ගේ / මහ කොමසාරිස්වරුන්ගේ සේවා පළපුරුද්ද හෝ සුදුසුකම් කවරේද;

(v) ශ්‍රී ලංකාව වෙනුවෙන් පසුගිය වසර පහක කාලය එක් එක් තානාපති කාර්යාලය විසින් ඉටුකරන ලද වැදගත් කාර්යයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවෙන් ඉහත සඳහන් එක් එක් තානාපති කාර්යාලයට හෝ මහ කොමසාරිස් කාර්යාලයට පත්කර යවන ලද කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව කවරේද;

(ii) ඉහත සඳහන් එක් එක් තානාපති කර්යාලයේ හෝ මහ කොමසාරිස් කාර්යාලයේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් වාර්ෂිකව දරන ලද පිරිවැය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1831/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි යෝධ ඇළ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මීට වර්ෂයකට පමණ පෙර මුල්ගල් තැබූ බවත්;

(ii) මෙතෙක් එහි ප්‍රතිසංස්කරණ කටයුතු සමාරම්භක උත්සවයට පමණක් සීමා වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) යෝධ ඇළ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(ii) ප්‍රතිසංස්කරණ කටයුතු මෙතෙක් ආරම්භ නොකිරීමට හේතු කවරේද;

(iii) ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2151/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2007 වර්ෂයේදී වීරවිල ගුවන් තොටුපලට අරමුදල් රැස් කිරීම පිණිස ආරම්භ කළ ලොතරැයිපතේ වටිනාකම කොපමණද;

(ii) මේ වනවිට මුද්‍රණයකර ඇති එම ලොතරැයිපත් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ලොතරැයිපතේ නම කුමක්ද;

(iv) එම ලොතරැයිපතින් ලැබූ ලාභය හෝ අලාභය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ලොතරැයිය දිනුම් අදින ලද දිනය කවරේද;

(vi) ඒ යටතේ බෙදාදුන් ත්‍යාග කවරේද;

(vii) එම ලොතරැයිය පවත්වාගෙන යාම සඳහා ගුවන් තොටුපල හා ගුවන්සේවා සමාගම වෙත ලොතරැයි මණ්ඩලය විසින් ගෙවන ලද බදු හෝ කුලී ප්‍රමාණය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(viii) මෙම ටිකට්පත ආරම්භ කිරීමෙන් අපේක්ෂිත ඉලක්ක මේ වනවිට සපුරාගෙන තිබේද;

(ix) එසේ නම්, ඒ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2260/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2012 අයවැය යෝජනා මගින් විශ්වවිද්‍යාල සිසුන් සඳහා දැනට ලබා දෙන මහපොල ශිෂ්‍යත්ව මුදල වැඩි කිරීමට පියවර ගෙන තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1708/'11

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ඇති සියලුම ලියාපදිංචි දේශපාලන පක්ෂවල නම් කවරේද;

(ii) ඉහත සඳහන් දේශපාලන පක්ෂවල නිලධාරීන් ලෙස කටයුතු කරන පුද්ගලයන්ගේ නම් කවරේද;

(iii) ලියාපදිංචි දේශපාලන පක්ෂවල ගිණුම් වාර්ෂික පදනමින් ලබාදී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ලියාපදිංචි කරන අවස්ථාවේදී තිබිය යුතු කොන්දේසි සපුරා නොතිබීම හේතුවෙන් ලියාපදිංචිය අවලංගු කරන ලද දේශපාලන පක්ෂවල නම් කවරේද;

(ii) මැතිවරණ කොමිසමෙන් හෝ මැතිවරණ කොමසාරිස්වරයාගේ කාර්යාලයෙන් ඉකුත් වර්ෂ තුනක කාලය තුළ, එක් එක් වර්ෂයේදී එම එක් එක් දේශපාලන පක්ෂය වෙත ලැබුණු මුදල් ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1832/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල භූමිය තුළ වර්ෂ ගණනාවක් තිස්සේ රුපියල් කෝටි ගණනක් වටිනා රථවාහන රැසක් දිරාපත් වෙමින් පවතින බවත්;

(ii) රාජ්‍ය සම්පත් එලෙස විනාශවීමට ඉඩහැරීම ජාතික අපරාධයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් රථවාහන අලුත්වැඩියා කර නැවත ධාවන කටයුතු සඳහා යොදා නොගැනීමට හේතු කවරේද;

(ii) එම වාහන අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2153/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා කැරම් මූලස්ථානය දැනට පවත්වාගෙන යන ස්ථානය කවරේද;

(ii) එය කුලී හෝ බදු පදනම මත පවත්වාගෙන යන්නේද;

(iii) වත්මන් ස්ථානයට රැගෙන ඒමට පෙර කැරම් මූලස්ථානය පැවති ස්ථානය කවරේද;

(iv) එම ස්ථානයෙන් ඉවත්වීමට හේතු වූ කරුණු කවරේද;

(v) දැනට පවත්නා ස්ථානයේ ඇති පහසුකම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා කැරම් සම්මේලනය පවත්වාගෙන යාමට නිත්‍ය ස්ථානයක් ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) කැරම් ක්‍රීඩාවේ අනාගතය සුරක්ෂිත කිරීම සඳහා දැනට ගෙන ඇති හා ඉදිරියේදී ගැනීමට නියමිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2324/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2004 සිට 2011 දක්වා කාල සීමාව තුළ අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල වාර්තා වූ වකුගඩු රෝගීන් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උතුරු මැද පළාතේ සීඝ්‍රයෙන් ව්‍යාප්ත වී ඇති වකුගඩු රෝගයට නිශ්චිත හේතු හඳුනාගැනීම සඳහා උපයෝගී කර ගත් ක්‍රමවේදය කවරේද;

(iii) මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග තුළින් එම රෝග ව්‍යාප්තිය පාලනය වී තිබේද;

(iv) නොඑසේ නම්, එම රෝගය පාලනයට ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වකුගඩු රෝගීන්ට ප්‍රතිකාර කිරීමට අවශ්‍ය පහසුකම් ඇති රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) කොළඹ ජාතික රෝහලේ සහ මහනුවර මහ රෝහලේ ඇති වකුගඩු රෝගීන් සඳහා අවශ්‍ය ශල්‍යකර්ම කිරීමට පහසුකම් සහිත වාට්ටු සංඛ්‍යාව කොපමණද;

(iii) ශල්‍යකර්මවලින් අනතුරුව අවශ්‍ය පහසුකම් යටතේ රජයේ රෝහල්වල රඳවා ගැනීමට හැකි වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iv) වෙළඳපොලේ පවතින හිඟය නිසා දැනට අධික මිල ගණන් යටතේ අලෙවිකරන වකුගඩු රෝගීන් සඳහා අවශ්‍ය ඖෂධ ප්‍රමාණවත් ලෙස රජයේ රෝහල්වලට ලබා දීමට කටයුතු කර තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 ජනවාරි මස 24 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1710/'11

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලාංකික පවුලක ඉපයීම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) දරිද්‍රතා රේඛාවට පහළින් සිටින පවුල් සංඛ්‍යාව දිස්ත්‍රික්ක පදනමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ශ්‍රී ලංකාවේ දරිද්‍රතා රේඛාව තීරණය කරන සාධකය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1833/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ දෙමළ මාධ්‍ය රජයේ පාසල්වල දුෂ්කර සේවා කාලය අවසන් වීමෙන් පසු මාරුවීම් නොලැබ දැඩි කලකිරීමට පත් ගුරුවරුන් විශාල සංඛ්‍යාවක් සිටින බවත්;

(ii) එසේ කලකිරීමට පත්වීම එම ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ක්‍රියාවලියේ ගුණාත්මකභාවය පිරිහීමට හේතු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට මාතර දිස්ත්‍රික්කය තුළ ස්ථාන මාරු වීම් ඉල්ලා සිටින දෙමළ මාධ්‍ය ගුරුවරුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් නියමිත සුදුසුකම් සපුරා ඇති ගුරුවරුන්ට ස්ථාන මාරු ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2134/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2007 අයවැය යෝජනා යටතේ පාඩු ලබන ඇඟලුම් කර්මාන්ත නගා සිටුවීම සඳහා රජය වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදල් ලබාදුන් ඇඟලුම් කර්මාන්තශාලාවල නම් සහ ලිපිනයන් කවරේද;

(iii) එම එක් එක් කර්මාන්තශාලාව සඳහා ලබා දුන් මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඇඟලුම් කර්මාන්තශාලා සඳහා මුදල් ලබා දුන් මූල්‍ය ආයතන කවරේද;

(v) එම එක් එක් මූල්‍ය ආයතනය විසින් ලබා දී ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) මුදල් ලබාගත් ඇඟලුම් කර්මාන්තශාලා විසින් මේ වනවිට ගෙවා ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(vii) මේ වනවිට ගෙවීමට ඇති මුදල් ප්‍රමාණයන් කොපමණද;

(viii) එම මුදල් ලබා ගැනීමෙන් පසු එක් එක් කර්මාන්තශාලාව විසින් උත්පාදනය කර ඇති රැකියා අවස්ථා ගණන කොපමණද;

(ix) එම කර්මාන්තශාලා අතරින් මේ වනවිට ක්‍රියාත්මක වන කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2325/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ස්වේච්ඡා සේවයේ නියුතු ගුරුවරුන් ගුරු සහායකවරුන් ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවයේ නියුක්ත කර ඇති බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) ස්වේච්ඡා ගුරුවරුන් ගුරු සහායකවරුන් ලෙස බඳවා ගනු ලැබූ වර්ෂය කවරේද;

(ii) දැනට සේවයේ නියුතු ගුරු සහායකවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ගුරු සේවයේ 3-II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලද ගුරු සහායකවරු සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් ගුරුවරයෙකුට දැනට ගෙවනු ලබන මාසික වේතනය කොපමණද;

(v) ගුරු සහායකවරුන්ගේ තනතුරු නාමය වෙනස් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ගුරු සහායකවරුන් ලෙස බඳවා ගත් සියලුදෙනා ගුරු සේවයට බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය යටතේ ස්ථිරකර අදාළ ශ්‍රේණියේ වැටුප් තලයක පිහිටුවීමටත්;

(ii) ගුරු සහායකවරුන් ලෙස බඳවාගත් දිනයේ සිට බලපවත්වන පරිදි ඔවුන් සේවයේ ස්ථිර කිරීමටත්;

කටයුතු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2540/'12

ගරු අනුර දිසානායක මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගුවන් තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් 2009 වර්ෂයේ සිට මේ දක්වා යෙදී ඇති විදෙස් සංචාර සංඛ්‍යාව එක් එක් පුද්ගලයාට අදාළව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් සංචාරයට අදාළ වූ රටවල්, සංචාරයේ අරමුණු හා ලැබුණු ප්‍රතිඵල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත එක් එක් සංචාරය සඳහා සහභාගී වූ එක් එක් පුද්ගලයා වෙනුවෙන් වැය කළ මුදල් ප්‍රමාණයන්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2557/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2006 සිට මේ දක්වා යුද, නාවික සහ ගුවන් හමුදාවන්හි සේවය අතහැර පලාගිය සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එසේ හමුදා අත්හැර පලාගිය පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට නීතිමය බලය සතු බලධාරීන් කවුරුන්ද;

(iii) 2006 වර්ෂයේ සිට 2011 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ අත්අඩංගුවට ගත්, පලාගිය ත්‍රිවිධ හමුදා සාමාජිකයින් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2012 ජනවාරි 01 සිට මාර්තු 31 දක්වා කාලය තුළ ත්‍රිවිධ හමුදාවෙන් පලාගිය ගිය පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම සඳහා වැටලීම් සිදු කරන ලද ප්‍රදේශ කවරේද;

(v) එම වැටලීම් මගින් අත්අඩංගුවට ගනු ලැබූ පුද්ගලයන්ගේ නාමලේඛනය ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2950/'12

ගරු අජිත් කුමාර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ සමෘද්ධි නිලධාරී සුභසාධක අරමුදල ආරම්භ කළ දිනය කවරේද;

(ii) ආරම්භයේ සිට මේ දක්වා එම අරමුදලට බැරවී ඇති මුළු මුදල කොපමණද;

(iii) 2012 ජුනි 30 දිනට එම අරමුදලින් ගෙවීම් කර ඇති නිලධාරීන් සංඛ්‍යාව, ඔවුන්ට ගෙවා ඇති මුළු මුදල සහ අරමුදලේ ශේෂය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම අරමුදලෙහි,

(i) මුදල් භාවිතා කළ හැකි කාර්යයන්;

(ii) නීතිමය තත්ත්වය විග්‍රහ කරන පනත් හා රෙගුලාසි;

(iii) සාමාජිකයෙකුගේ සුභසාධක ඉල්ලීමකට අදාළ ගෙවීම සිදුකිරීමට ගතවන කාලය;

(iv) සමාජිකයෙකුට හිමි ගෙවීම සිදුකිරීමේදී නියමිත කාලය ඉක්ම යන්නේ නම්, ඊට හේතු;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සමෘද්ධි නිලධාරී සුභසාධක අරමුදල භාවිත කර වෙනත් ආයෝජන සිදුකරනු ලබන්නේද;

(ii) එසේ නම්, ආරම්භයේ සිට මේ දක්වා සිදුකළ ආයෝජනයන්ගෙන් උපයාගෙන ඇති ලාභය කොපමණද;

(iii) එම ලාභ බෙදීයන පාර්ශ්වයන් කවරේද;

(iv) එම එක් එක් පාර්ශ්වයන් වෙත බෙදීයන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1742/'11

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2010 ජූලි මාසයේ සිට මේ දක්වා වූ කාලය තුළ, එක් එක් වර්ෂයේදී හා එක් එක් මාසයේදී,

(i) මුළු සහල් පරිභෝජනය සහ ඒක පුද්ගල සහල් පරිභෝජනය කොපමණද;

(ii) සමස්ත දේශීය සහල් නිෂ්පාදනය සහ ඒක පුද්ගල සහල් නිෂ්පාදනය යල සහ මහ කන්නවලදී, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ආනයනය කළ සහල් ප්‍රමාණය කොපමණද;

(iv) ආනයනය කළ සහල් ප්‍රමාණයේ වටිනාකම කොපමණද; සහ

(v) සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කරමින් සහල් ආනයනකරුවන්ට සහ වී වගාකරුවන්ට රජය විසින් ලබා දී ඇති සැබෑ සහනාධාර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 සහ 2011 වර්ෂවලදී ශ්‍රී ලංකාව තුළ සහල් කිලෝවක නිෂ්පාදන වියදම කොපමණද;

(ii) වී වගාවේ නියුතු පවුල් සංඛ්‍යාව කොපමණද; සහ

(iii) ආනයනය කළ සහ දේශීයව නිෂ්පාදිත සහල් කිලෝවක් සඳහා පනවා ඇති සියලුම බදු (ඍජු සහ වක්‍ර) කවරේද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1878/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල අධ්‍යාපන කලාපයේ, හාල්පන්දෙණිය රත්න විද්‍යාලය වසා දැමීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම පාසලේ සම්පත් යොදා ගෙන රජයේ කර්මාන්ත ශාලාවක් හෝ වෙනත් කටයුත්තක් ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා සැලසුම් සකස් කර තිබේද;

(iii) එම සැලසුම් අනුව පාසලේ ආරම්භ කිරීමට අපේක්ෂිත කටයුත්ත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2155/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 වර්ෂය තුළදී දේශීය හෝ විදේශීය ආයෝජකයන්ට ලබා දීමට තීරණය කළ හෝ ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් පිහිටි ස්ථාන සහ එක් එක් ඉඩමේ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ආයෝජකයින්ට එම එක් එක් ඉඩම ලබා දීමට හේතු කවරේද;

(iv) එම ඉඩම් ලබා දෙන කාල සීමාව සහ ඉඩම් ලබාදීමේ පදනම කවරේද;

(v) ලබා දුන් හෝ ලබා දෙන එක් එක් ඉඩම වෙනුවෙන් ලැබුණු මුදල හෝ ලැබීමට අපේක්ෂිත මුදල කොපමණද;

(vi) ඉඩම් ලබාදීමෙන් ලැබෙන මුදල යොදාගනු ලබන කටයුත්ත කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2328/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පොලිස් නිලධාරීන් සමග සමාන රාජකාරියේ යෙදෙන පොලිස් ආරක්ෂක සහායකයින්, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවයේ ස්ථිර කර විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) පොලිස් ආරක්ෂක සහායකයින්ගේ සේවය ස්ථිර කිරීම පොලිස් දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය යටතේ සිදු කරනු ලැබුවේද;

(ii) ඔවුන්ට නිසි නිල ඇඳුමක් සහ රාජකාරියේ යෙදෙන අවස්ථාවල තොරතුරු සටහන් පොතේ රාජකාරි වාර්තා කිරීමේ අවසරය ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) පොලිස් නිලධාරීන්ට හිමි වැටුප් වර්ධක, කලාප දීමනා, ගමන් වියදම්, දුෂ්කර දීමනා, බටා දීමනා සේවය ස්ථිර කළ දින සිටම පොලිස් ආරක්ෂක සහායකයන්ට ගෙවා තිබේද;

(iv) එසේ ගෙවා නොමැති නම්, එම වරප්‍රසාද ඔවුන්ට ලබාදීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1743/'11

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2010 ජූලි මාසයේ සිට මේ දක්වා වූ කාලය තුළ, එක් එක් වර්ෂයේදී, එක් එක් මාසයේදී,

(i) සමස්ත ටින් මාළු පරිභෝජනය සහ ඒක පුද්ගල ටින් මාළු පරිභෝජනය කොපමණද;

(ii) සමස්ත දේශීය ටින් මාළු නිෂ්පාදනය සහ ඒක පුද්ගල ටින් මාළු නිෂ්පාදනය කොපමණද;

(iii) ආනයනය කළ ටින් මාළු ප්‍රමාණය කොපමණද;

(iv) ආනයනය කළ ටින් මාළු ප්‍රමාණයේ වටිනාකම කොපමණද; සහ

(v) සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කරමින් ටින් මාළු සඳහා රජය විසින් ලබා දී ඇති තථ්‍ය සහනාධාර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ටින් මාළු ආනයනය සඳහා පනවා ඇති සියලුම බදු (ඍජු සහ වක්‍ර) කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1880/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල අධ්‍යාපන කලාපයට අයත්, කටුවන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය මගින් පාලනය වන මිද්දෙණිය ප්‍රාථමික විද්‍යාලයේ පවතින ගොඩනැගිලි හා ගුරු හිඟය නිසා සිසුන් දැඩි දුෂ්කරතාවන්ට මුහුණ පා ඇති බවත්;

(ii) එම විදුහලේ ගොඩනැගිලි හිඟය සහ ගුරු හිඟය පිළිබඳව බලධාරීන්ට දන්වා සිටියත් මේ දක්වා විසඳුමක් ලැබී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීමට සැලසුම්කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) මුදල් වෙන්කර තිබේ නම්, ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2158/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුලියාපිටිය අධ්‍යාපන කලාපයේ, පඬුවස්නුවර අධ්‍යාපන කොට්ඨාසයේ හෙට්ටිපොල ආදර්ශ ප්‍රාථමික විද්‍යාලයේ බහුකාර්ය තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකරන්නේද;

(ii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) ඒ සඳහා ප්‍රතිපාදන සපයාගත් ආකාරය කවරේද;

(iv) එකී ඉදිකිරීම් රජයේ ප්‍රතිපාදන මත සිදු නොකරන්නේ නම්, ප්‍රතිපාදන ලබා දුන් අයගේ නම සහ ලිපිනය කවරේද;

(v) එම ඉදිකිරීම ආරම්භකරන ලද දිනය කවරේද;

(vi) ගිවිසුම් අනුව එහි ඉදිකිරීම් අවසන් කළ යුතු දිනය කවරේද;

(vii) මේ වනවිට එකී ඉදිකිරීම් අවසන්කර තිබේද;

(viii) ඉදිකිරීම් අවසන්කර නොමැති නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2330/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා පොලිස් සේවාවට සහයවීම සඳහා 2006.08.02 දින අංක 16/1395/206/052 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ස්ථාපනය කර ඇති බවත්;

(ii) යුදමය වාතාවරණයක් පැවති අවස්ථාවේදී, ජාතික වැදගත්කමක් ඇති උත්සවවලදී සහ විවිධ ආපදා අවස්ථාවන්හිදී සිවිල් ආරක්ෂක නිලධාරීන් පූර්ණ කැපවීමෙන් කටයුතු කර ඇති බවත්;

(iii) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් 2009.12.15 වැනි දින නිකුත් කළ චක්‍රලේඛයෙහි 2009.10.31 වැනි දිනට අඛණ්ඩව දින 180ක සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන්ගේ සේවය කඩිනමින් ස්ථිර කරන බවට සඳහන් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දැනට සිවිල් ආරක්ෂක සේවයේ නියුතු කාර්ය මණ්ඩලය කොපමණද;

(ii) එම සේවයේ විවිධ ක්ෂේත්‍රවල සේවය කරන එක් එක් නිලධාරීන්ට දැනට ගෙවනු ලබන දෛනික වැටුප කොපමණද;

(iii) දෛනික වැටුපට සේවය කරන ඉහත දෙපාර්තමේන්තුවේ සේවකයින්ගේ සේවය ස්ථිර කර, ස්ථිර වැටුප් තලයක පිහිටුවා රජයේ නිලධාරීන්ට හිමි සියලුම වරප්‍රසාද ලබාදීමට කටයුතු කරන්නේද;

(iv) ඒ සඳහා ගතවන කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?